# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,449 - 2025 අගෝස්තු මස 07 වැනි බ්‍රහස්පතින්දා - 2025.08.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් | — |
| අවසාන නියෝග | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත | — |
| මධ්‍යම පළාත | — |
| දකුණු පළාත | — |
| උතුරු පළාත | — |
| නැගෙනහිර පළාත | — |
| වයඹ පළාත | — |
| උතුරු මැද පළාත | — |
| ඌව පළාත | — |
| සබරගමුව පළාත | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත | — |
| මධ්‍යම පළාත | — |
| දකුණු පළාත | — |
| උතුරු පළාත | — |
| නැගෙනහිර පළාත | — |
| වයඹ පළාත | — |
| උතුරු මැද පළාත | — |
| ඌව පළාත | — |
| සබරගමුව පළාත | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් | 288 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් | 293 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළ කිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තතු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 අගෝස්තු මස 29 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 අගෝස්තු මස 15 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2025 ජූනි මස 09 වැනි දින ,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


287 - B 082708 - 353 (2025/08)
E - 01

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් වන්නිආරච්චි වනිගසේකර චින්තා පද්මිණි වනමම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) වන උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1996.08.06 වැනි දින ප්‍රදානය කර ඇති අංක හම්/2/ප්‍ර/38623 දරන ජීවිත භුක්ති ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන තණලන්ද, අම්බලන්තොට යන ලිපිනයෙහි පදිංචි ගොඩයලාගේ බේබිනෝනා යන අය වෙත ප්‍රදානය කොට ඇති පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙක් නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බව මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.29 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නැගෙනහිර ගිරුවා පත්තුවේ තවාලුවිල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, තවාලුවිල නමැති ගමේ පිහිටා ඇති, සර්වේයර් ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 36 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අ. ග. සි. 466 දරන රේඛා සටහනේ කැබලි අංක 462 හි සඳහන් ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.058 ක විශාලත්වයෙන් යුත් පහත පරිදි මායිම් වූ රජයේ ඉඩම් කොටස.

*උතුරට* : ලොට් 331 සහ 461 ද,
*නැගෙනහිරට* : ලොට් 338 ද,
*දකුණට* : ලොට් 463,
*බස්නාහිරට* : ලොට් 332 ද වේ.

**චින්තා පී. ඩබ්. වන්නිආරච්චි,**
ප්‍රාදේශීය ලේකම්,
අම්බලන්තොට.

2025 අප්‍රේල් මස 07 වැනි දින.

08 - 52/1

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් රණවීර ආරච්චිගේ චතුරි දමිත්‍රා වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) වන උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1994.10.14 දින ප්‍රදානය කර ඇති අංක හම්/7/ප්‍ර/20501 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන වැලිපිටිය පදිංචි මුරුතමුරේ ගමගේ කරෝලිස් වෙත ප්‍රදානය කොට පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.29 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උතුරු ගිරුවා පත්තුවේ, වැලිපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වැලිපිටිය නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේයර් ජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේයර් ජනරාල්වරයා විසින් සම්පාදිත අතිරේක අංක 03 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අවසාන ගම් පිඹුරු අංක 391 දරන රේඛා සටහනේ අංක 99 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.418 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම:

*උතුරට* : ලොට් 104 ද,
*නැගෙනහිරට* : ලොට් 100 ද,
*දකුණට* : ලොට් 115 සහ 116 ද,
*බස්නාහිරට* : ලොට් 98 සහ 116 ද වේ.

**ආර්. ඒ. චතුරි දමිත්‍රා,**
ප්‍රාදේශීය ලේකම්,
කටුවන.

2025 අප්‍රේල් මස 05 වැනි දින.

08 - 52/2

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) ඉන්දික රුවන් කුමාර විතාරණ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1997.09.03 වැනි දින ප්‍රදානය කර ඇති අංක හම්/6/ප්‍ර 46731 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන වීරකැටිය, හතමුනයාය පදිංචි කළුදූරගේ මිසිනා වෙත ප්‍රදානය කොට තංගල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 1486 යටතේ 1998.08.27 දින ලියාපදිංචි කර ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.29 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උතුරු ගිරුවා පත්තුවේ, බුද්ධියගම බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අ. ග. පි. 242 - හතමුන නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, අංක අ. ග. පි. 372 දරන කට්ටි කැඩීමේ පිඹුරේ ප්‍රමාණයෙන් අක්කර 01 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද, ඉඩම : හැළඹහේන.

| | |
|---|---|
| *උතුරට* | : එල්. එල්. 72279 ගුනදාස පදිංචි ඉඩම ද, |
| *නැගෙනහිරට* | : මාර්ග රක්ෂිතය ද, |
| *දකුණට* | : කේ. මැගිලින්නෝනා පදිංචි ඉඩම ද, |
| *බස්නාහිරට* | : මුණසිංහගේ දියෝනිස් පදිංචි ඉඩම ද වේ. |

අයි. ආර්. කේ. විතාරණ,
ප්‍රාදේශීය ලේකම්,
වීරකැටිය.

2025 මාර්තු මස 21 වැනි දින.

08 - 52/3

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

වයඹ පළාත් සභාවේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පඬුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඉලංගරත්න පතිරාජගේ නුවන් ප්‍රසාද් තිලකරත්න වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1993.03.06 වැනි දින ප්‍රදානය කර ඇති අංක කුරු/ප්‍ර35741 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන ඇටුවන්මුල්ල, මණ්ඩපොල පදිංචි මහාචාරිනයිදෙලාගේ සමාරිස්හාමි වෙත ප්‍රදානය කොට කුරුණෑගල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක D 233/1800/93 යටතේ 1993.07.05 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.29 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ, පඬුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දේවමැදි හත්පත්තුවේ ගිරාතලාන කෝරළේ 1353 - දිග්ගලගදර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඇටුවන්මුල්ල නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, කුරුණෑගල මිනුම් අධිකාරි භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 1728 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 40 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.365 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම තල්ගහමුලහේන.

| | |
|---|---|
| *උතුරට* | : අ. ග. පි. 1728 පත්‍ර 01 හි කැබලි අංක 39 ද, |
| *නැගෙනහිරට* | : අ. ග. පි. 1728 පත්‍ර 01 හි කැබලි අංක 22 සහ අ. ග. පි. 1727 දිග්ගලගෙදර ගම් මායිම ද, |
| *දකුණට* | : අ. ග. පි. 1728 පත්‍ර 01 හි කැබලි අංක 28 ජී ද, |
| *බස්නාහිරට* | : අ. ග. පි. 1728 පත්‍ර 01 හි කැබලි අංක 39 ද වේ. |

අයි. පී. එන්. පී. තිලකරත්න,
ප්‍රාදේශීය ලේකම්,
පඬුවස්නුවර - බටහිර.

2025 පෙබරවාරි මස 19 වැනි දින.

08 - 106/1

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

වයඹ පළාත් සභාවේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඩබ්ලිව්. ආර්. ඒ. සාගරිකා සී. හේරත් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති තුමා විසින් එක්දහස් නවසිය අසූ තුනක් වූ මාර්තු මස විසිඑක් වන (1983.03.21) දින ප්‍රදානය කර ඇති අංක. කුරු/ප්‍ර 04060 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන මැල්සිරිපුර, නාබැට යන ලිපිනයෙහි පදිංචි ලියන රාලලාගේ අප්පුහාමි වෙත ප්‍රදානය කොට, ඔහු මිය ගොස් ඇති බැවින් ඔහුගේ කලත්‍රයා වන ඊ. එම්. සෝමාවතී හෙවත් ජේ. එම්. සෝමාවතී වෙත එම ඉඩම පවරා ඇත. කුරුණෑගල දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක KU/I/01/189 යටතේ 1999.10.14 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.29 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ, ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉහළ ඕතොට කෝරළේ 101 - දියතුරේ (නව 412 - දියතුරේ) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, නාබැට නැබැට නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, ක්ෂේත්‍ර පත්‍රයෙහි 2803 දරන රේඛා සටහනේ අංක 424 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් බිංදුවයි දශම හතරයි පහයි පහක් (0.455) විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම:

*උතුරට* : කැබලි අංක 422 සහ 421 ප්‍රවේශ මාර්ගය,
*නැගෙනහිරට* : කැබලි අංක 113 සහ 423,
*දකුණට* : කැබලි අංක 425,
*බස්නාහිරට* : කැබලි අංක 421 ප්‍රවේශ මාර්ගය.

ඩබ්ලිව්. ආර්. ඒ. සාගරිකා සී හේරත්,
ප්‍රාදේශීය ලේකම්,
ඉබ්බාගමුව.

2025 අගෝස්තු මස 06 වැනි දින.

08 - 106/2

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

සබරගමුව පළාත් සභාවේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඉළුක්කුඹුර රත්නායක මුදියන්සේලාගේ ප්‍රදීපිකා දමයන්ති ඉළුක්කුඹුර වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ ඒ. කෝල්ඩ්කෝට් ගරුතර අග්‍රාණ්ඩුකාර විසින් 1943.09.26 දින ප්‍රදානය කර ඇති අංක. R-817 ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන වෙරළුප පදිංචි ජේලි විදානෙලාගේ රත්‍රංහාමි වෙත ප්‍රදානය කොට රත්නපුර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක R-817 යටතේ 1943.10.09 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.29 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කයේ, රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දකුණු උඩ පත්තුවේ, කුරුවිට කෝරළේ, රත්නපුර මහනගර සභා සීමාව තුළ (පැරණි ග්‍රාම නිලධාරි වසම ගොඩිගමුව) කොස්පැලවින්න ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වෙරළුප නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, ජොෂ්ඨ මිනින්දෝරු අධිකාරි භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත ක්ෂේත්‍ර පත්‍ර අංක 01K අවසාන ගම් සිතියමේ අංක 347 හි කැබලි අංක 193 දරන රූඩ් 02, පර්. 01 ක් විශාලත්වය ඇත්තා වූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : කැකුණගහගොඩ මූකලාන.

*උතුරට* : කැබලි අංක 183,
*නැගෙනහිරට* : කැබලි අංක 194,
*දකුණට* : කැබලි අංක 192,
*බස්නාහිරට* : කැබලි අංක 185.

අයි. ආර්. එම්. පී. ඩී. ඉළුක්කුඹුර,
ප්‍රාදේශීය ලේකම්,
රත්නපුර.

2025 ජුනි මස11 වැනි දින.

08 - 121/1

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

සබරගමුව පළාත් සභාවේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/(අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස් සපුතන්ත්‍රිගේ අනුරුද්ධිකා දිල්රුක් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995.11.13 දින ප්‍රදානය කර ඇති අංක රත්/ප්‍ර/4679 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන බටහිර කලටුවාව, පුවක්පිටිය පදිංචි ඉස්මාලගේ මේරිනෝනා වෙත ප්‍රදානය කොට අවිස්සාවේල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ඉ. සං. ආ. V 7/7 යටතේ 1986.05.08 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.29 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කයේ, ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුරුවිට කෝරළේ පල්ලෙ පත්තුවේ, බටහිර කලටුවාව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කලටුවාවකන්ද නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, අංක 716 දරන අවසාන ගම් පිඹුරෙහි අංක 147 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපණය කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.437 ක් ඇතැයි ගණන් බලා තිබෙන තැන්නපිටහේන යනුවෙන් හඳුන්වනු ලබන පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය:-

*උතුරට* : කැබලි අංක 143,
*නැගෙනහිරට* : කැබලි අංක 148,
*දකුණට* : කැබලි අංක 155,
*බස්නාහිරට* : කැබලි අංක 144.

එස්. ඒ. දිල්රුක්,
ප්‍රාදේශීය ලේකම්,
ඇහැලියගොඩ.

2025 ජනවාරි මස 16 වැනි දින.

08 - 121/2

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

සබරගමුව පළාත් සභාවේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් බටුගෙදර මොහොට්ටාලලාගේ භාග්‍යා මේඝවර්ණ ආරියදාස බටුගෙදර වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1996.07.25 දින ප්‍රදානය කර ඇති අංක රත්/ප්‍ර/34367 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන පාතගම පදිංචි කරවනැල්ලගේ බෙම්පි වෙත ප්‍රදානය කොට රත්නපුර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 02/2773 යටතේ 1996.12.20 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.29 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කයේ, කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩ පත්තුවේ, කුරුවිට කෝරළේ, පාතගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පාතගම නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේයර් ජනරාල්වරයා භාරයේ ඇති සර්වේයර් ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 255 දරන අවසාන ගම් පිඹුරෙහි අංක 5 1/2 කොටසක් දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කර ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් රූඩ් 02 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම අළුබෝගහ ගොඩැල්ල.

*උතුරට* : ප්‍රවේශ මාර්ගය,
*නැගෙනහිරට* : කේ. රෙජිලින්ගෙ බ. අ. 198/1664 දරන ඉ. සං. ආ. ඉඩම,
*දකුණට* : ජී. සිරිපාලගේ බ. අ. 404/5734 දරන ඉ. සං. ආ. ඉඩම,
*බස්නාහිරට* : ප්‍රවේශ මාර්ගය.

බී. එම්. බී. එම්. ඒ. බටුගෙදර,
ප්‍රාදේශීය ලේකම්,
කුරුවිට.

2024 නොවැම්බර් මස 22 වැනි දින.

08 - 121/3

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

සබරගමුව පළාත් සභාවේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/ (අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස් සපුතන්ත්‍රිගේ අනුරුද්ධිකා දිල්රුක් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995.10.30 දින ප්‍රදානය කර ඇති අංක රත්/ප්‍ර/11727 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන නැඳුරණ පදිංචි රාජපක්ෂ ආරච්චිලාගේ තේගිස් අප්පුහාමි වෙත ප්‍රදානය කොට අවිස්සාවේල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ඉ. සං. ආ. V 10/184 යටතේ 1996.09.17 හා ඉ. සං. ආ. V 10/302 2005.06.04 දින ලියාපදිංචි කරනු ලැබ ඇති අනතුරුව නැඳුරණ, ඇරැපොල පදිංචි වීරසූරිය ආරච්චිල්ලගේ ධම්මිකා යන අය වෙත පසු අයිතිය නම් කරන ලද පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.29 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කයේ, ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුරුවිට කෝරළේ, මැද පත්තුවේ නැඳුරණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, නැඳුරණ නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, අංක 53 දරන අවසාන ගම් පිඹුරෙහි සර්වේ ජනරාල් විසින් සම්පාදිත අංක අති/අංක 9 හි 8 හි අංක 33858 දරන රේඛා සටහනේ අංක 360 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපණය කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 404 ක් ඇතැයි ගණන් බලා තිබෙන කොහිලකන්ද හේන්යාය යනුවෙන් හඳුන්වනු ලබන පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය:-

*උතුරට* : ලොට් අංක 362, 357, 358,
*නැගෙනහිරට* : ලොට් අංක 358, 355,
*දකුණට* : ලොට් අංක 398, 355,
*බස්නාහිරට* : ලොට් අංක 361.

එස්. ඒ. දිල්රුක්,
ප්‍රාදේශීය ලේකම්,
ඇහැලියගොඩ.

2025 ජනවාරි මස 16 වැනි දින.

08 - 121/4

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

සබරගමුව පළාත් සභාවේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/ (අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස් සපුතන්ත්‍රිගේ අනුරුද්ධිකා දිල්රුක් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1996.05.17 දින ප්‍රදානය කර ඇති අංක රත්/ප්‍ර/27569 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන දෙයියාගල පදිංචි විතාන පතිරන්නැහැලාගේ ජුවානිස් අප්පු වෙත ප්‍රදානය කොට අවිස්සාවේල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ඉ. සං. ආ. V 17/86 යටතේ 1996.09.17 දින ලියාපදිංචි කරනු ලැබ ඇති, පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූල හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.29 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කයේ, ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුරුවිට කෝරළේ, පල්ලෙ පත්තුවේ හේවායින්න ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දෙයියාගල නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, අංක 711 දරන අවසාන ගම් පිඹුරෙහි සර්වේ ජනරාල් විසින් සම්පාදිත අංක බීඑස්එස්. එල්. 13/27 සහ 13/128 හි අංක 315 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපණය කර ඇති ප්‍රමාණයෙන් රූඩ් 03, පර්චස් 21 ක් ඇතැයි ගණන් බලා තිබෙන හීනටිදෙනිය හේන යනුවෙන් හඳුන්වනු ලබන පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය:-

*උතුරට* : ලොට් අංක 313, 304,
*නැගෙනහිරට* : ලොට් අංක 304, 323,
*දකුණට* : ලොට් අංක 323,
*බස්නාහිරට* : ලොට් අංක 314, 313.

එස්. ඒ. දිල්රුක්,
ප්‍රාදේශීය ලේකම්,
ඇහැලියගොඩ.

2025 ජනවාරි මස 16 වැනි දින.

08 - 121/5

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

සබරගමුව පළාත් සභාවේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/ (අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස් සපුතන්ත්‍රිගේ අනුරුද්ධිකා දිල්රුක් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1987.05.29 දින ප්‍රදානය කර ඇති අංක රත්/ප්‍ර/6095 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන ඇහැලියගොඩ, හිඳුරංගල පදිංචි මාම්පේ විතානගේ පවිනිස් පෙරේරා වෙත ප්‍රදානය කොට අවිස්සාවේල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ඉ. සං. ආ. V 4/68 යටතේ 1990.05.28 දින ලියාපදිංචි කරනු ලැබ ඇති, පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූල හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.29 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කයේ, ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුරුවිට කෝරළේ, මැද පත්තුවේ, කිරිපෝරුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හිඳුරංගල නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, අංක 56 දරන අවසාන ගම් පිඹුරේ අංක 577 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපණය කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.402 ක් ඇතැයි ගණන් බලා තිබෙන මූකලාන යනුවෙන් හඳුන්වනු ලබන පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය:-

| | |
|---|---|
| *උතුරට* | : 574, |
| *නැගෙනහිරට* | : 576, |
| *දකුණට* | : 578, |
| *බස්නාහිරට* | : 467. |

එස්. ඒ. දිල්රුක්,
ප්‍රාදේශීය ලේකම්,
ඇහැලියගොඩ.

2025 ජනවාරි මස 30 වැනි දින.

08 - 121/6

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* LTL/44/1694.

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

මුලතිවු දිස්ත්‍රික්කයේ, පුදුකුඩියිරුප්පු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක MU/42 කෝම්පාවිල් ග්‍රාම නිලධාරි වසමේ, කෝම්පාවිල් ගමේ ජනපද නිලධාරි විසින් අඳින ලද හා ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද දළ අනුරේඛනයේ ප්‍රමාණයෙන් හෙක්. 0.3045 වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා කමලනාදන් නකුලේශ්වරන් මයා නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත සඳහන් වේ.

| | |
|---|---|
| *උතුරට* | : සෙ. කජේන්තිරන්ගේ ඉඩම, |
| *නැගෙනහිරට* | : පාර, |
| *දකුණට* | : වී. සත්තියපාමාගේ ඉඩම, |
| *බටහිරට* | : පො. කවිතාගේ ඉඩම. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

*(අ)* *බදු කාලය.* - අවුරුදු තිහයි (30) (2025.04.10 සිට 2055.04.09 දක්වා);

*(ආ)* *වාර්ෂික බදු මුදල* .- 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන වන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහ හෝ පහකට (රු. 5,000,000) වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

වාර මුදල : වාර මුදලක් අය නොකෙරේ.

*(ඈ)* මෙම ඉඩම **වාණිජ කටයුතු සඳහා මිස** වෙනත් කටයුතු සඳහා නොයෙදවිය යුතු ය.

*(ඇ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළතදී පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතුය.

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඊ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* 2025.04.10 දින සිට අවුරුදු 05 ක් ගත වන තුරු බදුගත් කරුණ සාක්ෂාත් කරගැනීම සඳහා අතුරු බදු දීම් හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(එ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවක දී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොළියක් අය කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

කේ. ජී. පී. සෞම්‍යා,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2025 ජූලි මස 22 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

08 -53

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/76178.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :* HDLC/01/37/06/46.

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බටඅත දකුණ ග්‍රාම නිලධාරි වසමේ, බටඅත දකුණ ගමේ අ. ග. පි. 456 පිඹුරේ කැබලි අංක 1680 න් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.6067 ක් වන රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා ටෙකෝ ලංකා පුද්ගලික සමාගම නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත සඳහන් වේ.

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අංක 1360 සහ 1681, |
| *නැගෙනහිරට* | : කැබලි අංක 1360, 1681 සහ 1485, |
| *දකුණට* | : කැබලි අංක 1352, |
| *බටහිරට* | : කැබලි අංක 1680 සහ 1360. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

*(අ)* *බදු කාලය.* - අවුරුදු තිස් පහයි (35) (2013.01.20 දින සිට වසර 35 ක් ඉදිරියට);

*(ආ)* *වාර්ෂික බදු මුදල .-* බදුකරයේ ප්‍රථම අවුරුදු 05 ක් වන 2013.01.20 සිට 2018.01.19 බදු කාලය මුදලින් නිදහස්ය.
එතැන් සිට ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, 2013 වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලින් 50% ට නොවැඩි විය යුතුය.

වාර මුදල : කර්මාන්තපුර ඉඩමක් බැවින් වාර මුදලක් අය නොකෙරේ.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම **වාණිජ කටයුතු සඳහා හැර** වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් නිශ්චිත කාලය තුළ කර්මාන්තය ආරම්භ කිරීම සඳහා නිසි පියවර නොගන්නේ නම් ඉඩම් කොටස අවලංගු කර නැවත රජයට පවරා ගැනීමට හා බදු ගිවිසුම අවලංගු කිරීමට කටයුතු කරනු ලැබේ.

*(ඉ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඊ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත්කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* 2013.01.20 දින සිට වසර 05 ක් ගත වන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත්කරගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(එ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවක දී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොළියක් අය කරනු ලැබේ.

*ගැසට්* පත්‍රයේ පළ කළ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම් සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2025 ජූලි මස 23 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

08 - 66

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/78313.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :* UPLC/L/11/MA/L/242.

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

බදුල්ල දිස්ත්‍රික්කයේ, මහියංගණය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 7 ඒ - දඹාන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වෙල්පල්ලේවෙල ගමේ කැඩැස්තර සිතියම් අංක 710064, කලාප අංක 10, පත්‍ර අංක 1 හි කැබලි අංක 38 මඟින් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.7999 ක් වූ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා කනත්ත හේවාගේ රංජනී ද සිල්වා නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත සඳහන් වේ:-

*උතුරට* : කැබලි අංක 41, 43, 39, 29,
*නැගෙනහිරට* : කැබලි අංක 29, 36, 37,
*දකුණට* : කැබලි අංක 36, 37, 31, 75, 41,
*බටහිරට* : කැබලි අංක 75, 41, 43, 39.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

*(අ)* *බදු කාලය.* - අවුරුදු තිහයි. (30) (2025.07.23 දින සිට වසර 30 ක් ඉදිරියට);

*වාර්ෂික බදු මුදල* .- 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහ (රු. 5,000,000) හෝ රුපියල් මිලියන පහට (රු. 5,000,000) වඩා වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

වාර මුදල : අය නොකෙරේ.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/පළාත් ඉඩම් කොමසාරිස්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම **වාණිජ කටයුතු සඳහා** හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* පළාත් ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඉ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත්කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2025.07.23 දින සිට වසර 05 ක් ගත වන තුරු අතුරු බදුදීම් හෝ පැවරීම සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවක දී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොළියක් අය කරනු ලැබේ.

*ගැසට්* නිවේදනය පළ කරන දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම් සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2025 ජූලි මස 29 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

08 - 122

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.